සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

# පළමු වාර පරීක්ෂණය 2019 මාර්තු
# First Term Test, March 2019

| 10 ශ්‍රේණිය Grade 10 | බුද්ධ ධර්මය - I | පැය එකයි One hour |
|---|---|---|

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

---

01 බෝසතාණන් වහන්සේ තමන්ගේ අවසන් උපත සඳහා සුදුසු පසුබිම නුවණින් විමසා බැලූහ. එය හැඳින්වෙන්නේ,

(i) පාරමිතා නමිනි. (ii) පංච මහා විලෝකන නමිනි.
(iii) පංච අභිඥා නමිනි. (iv) අභීත සිංහ නාද පැවැත්වීම නමිනි.

02 සිදුහත් කුමරුට ශිල්ප ශාස්ත්‍ර ඉගැන්වූ බමුණු පඬිවරයා

(i) අසිත නම් වේ. (ii) භග්ගව නම් වේ.
(iii) කොණ්ඩඤ්ඤ නම් වේ. (iv) සර්වමිත්‍ර නම් වේ.

03 භද්දකච්චානා හෙවත් යසෝදරා දේවියගේ පියා වූයේ,

(i) අංජන රජතුමා ය. (ii) සුප්‍රබුද්ධ රජතුමා ය.
(iii) උදේනි රජතුමා ය. (iv) අමිතෝදන රජතුමා ය.

04 මහාමායා දේවිය කළුරිය කළේ සිදුහත් උපත සිදුවී දින

(i) හතකිනි (ii) තුනකිනි (iii) පහකිනි (iv) හයකිනි

05 ලොව උපන් සත්ත්වයා වයසට යාම, ලෙඩ වීම හා මිය යාම හෙවත් ජාති, ජරා, ව්‍යාධි, මරණ යන දුක් පීඩාවන්ට නිසැකවම ලක්වන බව බෝසත් කුමරු වටහා ගත්තේ,

(i) ලෙඩෙක් දැකීමෙනි. (ii) මහල්ලෙක් දැකීමෙනි.
(iii) සතර පෙර නිමිති දැකීමෙනි. (iv) නිබ්බුත පද ඇසීමෙනි.

06 මෙවන් පුතෙකු ලද මවක්, පියෙක් නිවුණෝ වෙති. යනුවෙන් පවසමින් සිදුහත් කුමරාට නිබ්බුත පද කීවේ,

(i) විශාඛා සිටුදුව (ii) සුජාතා සිටුදුව (iii) මහා ප්‍රජාපතී ගෝතමිය (iv) කිසාගෝතමිය

07 අපගේ ජීවිතයේ දී බොහෝ අභියෝග ජය ගැනීමට අපට සිදුවේ. ඒවා ජය ගැනීම සඳහා

(i) ඉවසීම අවශ්‍ය වේ. (ii) කැපවීම අවශ්‍ය වේ.
(iii) අධිෂ්ඨානය අවශ්‍ය වේ. (iv) ඉවසීම, කැපවීම හා අධිෂ්ඨානය අවශ්‍ය වේ.

08 අංගුලිමාල පිරිත දේශනා කරවා ගන්නේ,

(i) අමනුෂ්‍යය බිය දුරු කරවා ගැනීම සඳහා ය.
(ii) සසර බිය දුරු කරවා ගැනීම සඳහා ය.
(iii) ගැබිණි මාතාවන්ට ආශිර්වාද ලබාගැනීම සඳහා ය.
(iv) අපල උපද්‍රව දුරුකර ගැනීම සඳහා ය.

papers.lk

09 තමා විසින්ම පිළිපැද ඇස් පනාපිට මෙලොවදීම ප්‍රතිඵල දැකගත හැකි බැවින් ධර්ම රත්නය

(i) ස්වාක්ඛාත නම් වේ. (ii) සන්දිට්ඨික නම් වේ.

(iii) අකාලික නම් වේ. (iv) ඒහිපස්සික නම් වේ.

10 ගිහියා පවින් වළක්වා පිනෙහි පිහිටුවමින් මෙලොව, පරලොව සුඛිත මුදිත කිරීමට නිරතුරුව ක්‍රියා කරන්නේ,

(i) පාසලේ විදුහල්පති තුමාය. (ii) දහම් පාසලේ ගුරුවරයා ය.

(iii) පන්සලේ භික්ෂූන් වහන්සේ ය. (iv) සමාජයේ ප්‍රභුවරුන් ය.

11 අප තෙරුවන් සරණ යා යුත්තේ,

(i) ශ්‍රද්ධාව මුල්කරගෙන ය. (ii) ප්‍රඥාව මුල්කරගෙන ය.

(iii) භක්තිය මුල්කරගෙන ය. (iv) ශ්‍රද්ධාවත්, ප්‍රඥාවත් මුල්කරගෙන ය.

12 රහසත් පව් නොකොට..... යන කවිය ඇතුළත් ග්‍රන්ථය වන්නේ,

(i) බුත්සරණයි. (ii) බුදුගුණ අලංකාරයයි.

(iii) ලෝවැඩ සඟරාවයි. (iv) සුභාෂිතයයි.

13 බුදු දහමේ සූවිසි ගුණ සඳහන් වන්නේ,

(i) බුද්ධ රත්නයේ ය. (ii) ධම්ම රත්නයේ ය.

(iii) සංඝ රත්නයේ ය. (iv) ත්‍රිවිධ රත්නයේ ය.

14 බුදු දහමෙහි පංච නීවරණ උපමා මගින් දක්වා ඇත. එහිදී විචිකිච්ඡාව උපමා කර ඇත්තේ,

(i) බොර ජලයට (ii) පාසි සහිත ජලයට

(iii) උතුරන ජලයට (iv) කැළඹුන ජලයට

15 භාවනාව වඩන පුද්ගලයා ආචාර්යවරයකුගේ උපදෙස් ලබා තමාගේ චරිතයට අනුව කර්මස්ථානයක් තෝරා ගත යුතුය. එසේ තෝරාගත හැකි අරමුණු හෙවත් කර්මස්ථාන ගණන,

(i) නවයකි. (ii) එකොළහකි. (iii) හතළිහකි. (iv) හතකි.

16 කර්මස්ථාන ආචාර්යවරයකුගේ උපදෙස් නොලබා භාවනා කිරීමෙන් ප්‍රතිඵල නොලද භික්ෂුවක් වන්නේ,

(i) සැරියුත් හිමිය (ii) ස්වර්ණකාර හිමිය

(iii) ආනන්ද හිමිය (iv) නන්ද හිමිය

17 පංච අභිඥා අෂ්ට සමාප්තිය ලබාගැනීමට වැඩිය යුතු භාවනාව වන්නේ,

(i) විදර්ශනා භාවනාවයි. (ii) පිළිකුල් භාවනාවයි.

(iii) ප්‍රඥා භාවනාවයි. (iv) සමථ භාවනාවයි.

18 බුදු රජාණන් වහන්සේ ආර්ය මාර්ගයේ ගමන් කළ නිසාත්, නිර්වාණයට සැපත් වූ නිසාත්, යහපත් වචන ඇති නිසාත්

(i) අරහං නම් වේ. (ii) ලෝකවිදූ නම් වේ.

(iii) සුගත නම් වේ. (iv) පුරිසදම්ම සාරථී නම් වේ.

19 විකෘතියකින්, විපරීතයකින් තොරව ප්‍රකෘතිය ප්‍රකෘතිය ලෙස දැන දැක පසක් කර ගැනීමට වැඩිය යුතු භාවනාව වන්නේ,

(i) සමථ භාවනාවයි. (ii) විදර්ශනා භාවනාවයි.

(iii) පිළිකුල් භාවනාවයි. (iv) ආනාපාන සති භාවනාවයි.

20 කුසල කර්ම, අකුසල කර්මාදී වශයෙන් හැඳින්වෙන දිගු කලක් නැවත නැවත කිරීමෙන් ප්‍රබලත්වයට පත්වන චේතනාව පෙරටු කරගත් ක්‍රියා හැඳින්වෙන්නේ,

(i) සංඛාර ස්කන්ධය නමිනි. (ii) වේදනා ස්කන්ධය නමිනි.

(iii) සංඥා ස්කන්ධය නමිනි. (iv) විඤ්ඤාණ ස්කන්ධන නමිනි.

papers.lk

21 නිරහංකාර බව, ස්ථිර අධිෂ්ඨානය, විවිධ දුෂ්කරතා මැද වුවද අධ්‍යාපනය පිළිබඳ දැඩි ඇල්මක් දැක්වීම යන ආදර්ශ අපට ලබාගත හැකි චරිතයක් වන්නේ,

(i) චන්ද්‍රවිමල හිමිය. (ii) වැලිවිට සිරි සරණංකර හිමිය.

(iii) හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමිය. (iv) මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමිය.

22 දුටුගැමුණු රජතුමාගේ ප්‍රධානතම ශාසනික මෙහෙවර වූයේ,

(i) මිරිසවැටිය ඉදිකිරීමය. (ii) ලෝවා මහාපාය ඉදිකිරීමය.

(iii) ආක්‍රමණිකයින්ගෙන් රට බේරාගැනීමය. (iv) රුවන්වැලි මහා සෑය ඉදිකිරීමය.

23 තමා විසින් කරන ලද සියලු යහපත් ක්‍රියා පින් පොතක ලියා තැබීම, සතුරකුට වුවද ගරු කළ යුතු තැන ගරු කිරීම, බුදු සසුනේ දියුණුවට කටයුතු කිරීම යන ආදර්ශයන් අපට ලබාගත හැකි චරිතයක් වන්නේ,

(i) වැලිවිට සරණංකර හිමි (ii) මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි

(iii) දුටුගැමුණු රජතුමා (iv) අනගාරික ධර්මපාල තුමා

24 සිල්වත් සමාගම පිහිටුවා ගනු ලැබුවේ

(i) වාරියපොල සුමංගල හිමි (ii) වැලිවිට සරණංකර හිමි

(iii) මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි (iv) රේරුකානේ චන්ද්‍රවිමල හිමි

25 බොරු කියන තැනැත්තා, අන් අයගේ කඩකරන අයිතිවාසිකම වන්නේ,

(i) ජීවත්වීමේ අයිතිය

(ii) පෞද්ගලික දේපළ ආරක්ෂා කරගැනීමේ අයිතිය

(iii) සන්නිවේදන අයිතිය

(iv) සාමකාමී පවුල් ජීවිතයක් ගත කිරීමේ අයිතිය

26 තරුණවියේ පිළිවෙත් රැක්කේ ද නැත. ධනය රැස් කළේ ද නැත. දැන් මහලු වුයෙමි..... යනාදී වශයෙන් තැවෙන පුද්ගලයන් ගැන කියවෙන ධම්ම පද ගාථාවේ ඇති දෙපදය වන්නේ,

(i) අචරිත්වා බ්‍රහ්මචරියං - අලද්ධා යොබ්බනේ ධනං

(ii) උට්ඨානවතෝ සතිමතෝ - සුචිකම්මස්ස නිසම්මකාරිනෝ

(iii) අප්පමාදෝ අමතපදං - පමාදෝ මච්චුනෝ පදං

(iv) අත්තනාව කතං පාපං - අත්තනා සංකිලිස්සති

27 ත්‍රිලක්ෂණය යනු

(i) සීල, සමාධි, ප්‍රඥා

(ii) උප්පාද, ඨිති, භංග

(iii) අනිත්‍ය, දුක්ඛ, අනාත්ම

(iv) ඉන්ද්‍රිය සංවරය, සතිසම්පජඤ්ඤ, සන්තුට්ඨිකා

28 සංඝ රත්නය ලොව පහළ වූයේ,

(i) වෙසක් පුන් පෝය දින (ii) පොසොන් පුන් පෝය දින

(iii) ඇසළ පුන් පෝය දින (iv) දුරුතු පුන් පෝය දින

29 බෞද්ධයකු වීමේ පළමු පියවර වන්නේ,

(i) පන්සිල් සමාදන් වීමය. (ii) උප්පැන්න සහතිකයේ සඳහන් කිරීම.

(iii) තෙරුවන් සරණ යාමය. (iv) බෞද්ධ වත්පිළිවෙත් පිළිපැදීම ය.



papers.lk

30 භික්ෂූන් වහන්සේ සමාජයට බරක් නොවන ආකාරයෙන් ප්‍රත්‍ය පහසුකම් ලබා ගත යුත්තේ,

(i) බඹරා මල නොතලා රොන් ගන්නා සේ ය.

(ii) වේයා තුඹසක් බඳින්නා සේ ය.

(iii) මී මැස්සා මී වදයක් බඳින්නා සේ ය.

(iv) පැණි කුරුල්ලන් මල් පැණි බොන්නා සේ ය.

31 අප තුළ ඇතිවන රාග, ද්වේශ, මෝහ ආදී කෙලෙස් යටපත් කර ගැනීමට ඉවහල් වන භාවනාව වන්නේ,

(i) පිළිකුල් භාවනාව (ii) සතිපට්ඨාන භාවනාව

(iii) විදර්ශනා භාවනාව (iv) සමථ භාවනාව

32 සියලු කෙලෙස් මුළුමනින්ම නැති කොට ලබන නොබිඳෙන චිත්ත පාරිශුද්ධිය තුළින්ම ඇති තතු ඇති සැටියෙන් දැකීම හඳුන්වන්නේ,

(i) නිවන නමිනි. (ii) ප්‍රඥාව නමිනි.

(iii) විපරිත බව යනුවෙනි. (iv) දූරදර්ශී බව යනුවෙනි.

33 වැලිවිට සරණංකර හිමි රචනා කළ ග්‍රන්ථයක් නොවන්නේ,

(i) මුණිගුණාලංකාරයයි. (ii) බුදුගුණ අලංකාරයයි.

(iii) සාරාර්ථ සංග්‍රහයයි. (iv) සතර බණවර සන්නයයි.

34 ආර්ය අෂ්ටාංගික මාර්ගයේ සීලයට අයත් අංගයක් නොවන්නේ,

(i) සම්මා දිට්ඨි (ii) සම්මා වාචා (iii) සම්මා කම්මන්ත (iv) සම්මා ආජීව

35 භෝග විනාශවීමට හේතුවන කරුණු සඳහන් වන්නේ,

(i) පරාභව සූත්‍රයේ ය. (ii) වසල සූත්‍රයේ ය.

(iii) සිඟාලෝවාද සූත්‍රයේ ය. (iv) පත්තකම්ම සූත්‍රයේ ය.

36 සිල් රැකීමෙන් මෙලොවදී ලැබෙන ආනිසංස ගණන වන්නේ,

(i) හතරකි. (ii) පහකි. (iii) තුනකි. (iv) නවයකි.

37 කායික මෙන්ම මානසික සෞඛ්‍යයෙන් පිරිහීමට හේතු වන්නේ පන්සිල්වල කිනම් සිල්පද කඩ කිරීමෙන් ද?

(i) පළමුවන සිල්පදයයි. (ii) දෙවන සිල්පදයයි.

(iii) පස්වන සිල්පදයයි. (iv) හතරවන සිල්පදයයි.

38 මිනිසා ඇතුළු සියලුම සතුන්ගේ ජීවත්වීමේ අයිතිය සුරැකෙන්නේ පන්සිල්වල කීවන ශික්ෂාපදය ආරක්ෂා කිරීමෙන් ද?

(i) පළමුවන ශික්ෂා පදය (ii) දෙවන ශික්ෂා පදය

(iii) තුන්වන ශික්ෂා පදය (iv) පස්වන ශික්ෂා පදය

39 නිවන් පසක් කර ගැනීමට අවශ්‍ය වන මනා වූ පිළිවෙත් පුරන බැවින් මහා සංඝරත්නය

(i) සුපටිපන්න නම් වේ. (ii) උජුපටිපන්න නම් වේ.

(iii) සාමීචිපටිපන්න නම් වේ. (iv) ඤායපටිපන්න නම් වේ.

40 හිඳීම, සිටීම, ඇවිදීම ආදී සියලු ක්‍රියාවන්හිදී අවබෝධයෙන් යුතුවීම හඳුන්වන්නේ,

(i) ඉන්ද්‍රිය සංවරය නමිනි. (ii) සතර සංවර සීලය නමිනි.

(iii) සතිසම්පජඤ්ඤ නමිනි. (iv) සන්තුට්ඨිකා නමිනි.

(ලකුණු 1 x 40 = 40)



papers.lk

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

පළමු වාර පරීක්ෂණය 2019 මාර්තු
First Term Test, March 2019

10 ශ්‍රේණිය
Grade 10

# බුද්ධ ධර්මය - II

පැය දෙකයි
Two hours

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක් ද තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමි වේ.

---

(01) i. පංච මහා විලෝකනවලින් දෙකක් ලියන්න.

ii. සුද්දෝධන රජතුමා තම පුත් සිදුහත් කුමරුට සෘතු තුනට ගැළපෙන ලෙස මාලිගා තුනක් කරවා දුනි. ඉන් දෙකක් නම් කරන්න.

iii. සතර පෙර නිමිති නම් කරන්න.

iv. යසෝදරා දේවියට පුතෙකු ලැබුණ බව අසන්නට ලැබුණු මොහොතේ බෝසතාණන් වහන්සේගේ මුවින් පිටවූ ප්‍රකාශය ලියන්න.

v. "භාවේති කුසල ධම්මේ ආසේවති වඩ්ඪේති ඒතායතාති භාවනා" යන්නෙහි අදහස ලියන්න.

vi. සතර මහා භූත රූප නම් කරන්න.

vii. පුද්ගල චරිත හයකි. ඉන් දෙකක් නම් කරන්න.

viii. පංචස්කන්ධය නම් කරන්න.

ix. බුදු දහමේ සඳහන් සමාදානය හා විරමණය හඳුන්වන්න.

x. විපස්සනා භාවනාව හඳුන්වන වෙනත් නම් දෙකක් ලියන්න. (ලකුණු 2 x 10 = 20)

(02) i. වෙනත් කිසිදු උපතක දක්නට නොලැබුණ ආශ්චර්යමත් සිදුවීම් කිහිපයක් බෝසත් උපත සිදුවූ අවස්ථාවේ සිදුවිය. ඉන් දෙකක් ලියන්න. (ල. 02)

ii. බෝසතාණන් වහන්සේ අභියෝග ජයගත් අවස්ථා තුනක් නම් කරන්න. (ල. 03)

iii. ඔබගේ ජීවිතයේ දී මුහුණ දීමට සිදුවන අභියෝග ජයගන්නා අයුරු විස්තර කරන්න. (ල. 05)

(03) i. උට්ඨානවතෝ සතිමතෝ..... ගාථාව සම්පූර්ණ කරන්න. (ල. 02)

ii. එම ගාථාවේ තේරුම ලියන්න. (ල. 03)

iii. එම ගාථාවේ සඳහන් කරුණු ඇසුරින් ඔබගේ ජීවිතය සාර්ථක කරගත හැකි අයුරු පැහැදිලි කරන්න. (ල. 05)

(04) i. සීලය යනු කුමක් ද? (ල. 02)

ii. සිල්වත් වීමෙන් ලැබෙන ආනිසංස වලින් තුනක් ලියන්න. (ල. 03)

iii. පංච සීලය ආරක්ෂා කිරීම තුළින් පුද්ගල ජීවිතය සාර්ථක කරගත හැකි අයුරු කෙටියෙන් විස්තර කරන්න. (ල. 05)

(05) i. බුදු දහමේ සඳහන් ප්‍රධාන භාවනා ක්‍රම දෙක නම් කරන්න. (ල. 02)

ii. භාවනාවට පිවිසෙන තැනැත්තා පූර්ව අවශ්‍යතා 5 ක් ඉටුකර ගත යුතුය. ඉන් තුනක් නම් කරන්න. (ල. 03)

iii. සමථ භාවනාව වැඩීමෙන් දෛනික ජීවිතය සාර්ථක කරගත හැකි අයුරු පහදන්න. (ල. 05)

(06) i. දුටුගැමුණු රජතුමාගේ අභීත සටන් පාඨය කුමක් ද? (ල. 02)

ii. එතුමා කළ ජාතික ආගමික සේවාවලින් තුනක් ලියන්න. (ල. 03)

iii. දුටුගැමුණු රජුගේ චරිතාදර්ශ ඇසුරින් ඔබගේ ජීවිතය සාර්ථක කරගත හැකි අයුරු විස්තර කරන්න. (ල. 05)

(07) පහත මාතෘකාවලින් දෙකකට කෙටි සටහන් ලියන්න.

i. **වැලිවිට සරණංකර හිමි**

ii. **විපස්සනා භාවනාව**

iii. **පංච නීවරණ**

iv. **ත්‍රිලක්ෂණය** (ලකුණු 5 x 2 = 10)

papers.lk